**මුසාලි ප්‍රාදේශීය සභාව**
**මන්නාරම දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තම්බර් 11 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මුසාලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**-----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

**-------------------------**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

**-----------------------**

ඉකුත් වර්ෂයේ පානිය ජලය සැපයීම් සේවා ගාස්තු අයකරන සේවකයාගේ නොසැලකිලිමත්කම හේතුවෙන් සභාවට රු. 91,500 ක පාඩුවක් සිදුවී තිබුණි. එය මූල්‍ය ප්‍රකාශනවලට ගෙනවිත් නොතිබුණි.

#### 1.3.3 නොසැසැඳුණු ගිණුම්

**-----------------------**

2017 දෙසැම්බර් 31 දිනට වූ මුදලට සහ මුදල සමාන දෑ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 3,604,168 ක් ලෙස පෙන්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ ශේෂපත්‍රයේ එය රු. 3,600,168 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 4,000 ක් වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.4 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) රීති 178(3) | - | කොන්ත්‍රාත් වැඩ සාර්ථකව ඉටුකරන ප්‍රජා සංවිධාන, ප්‍රජා මධ්‍යස්ථානවල නම් ඇතුලත් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) රීති 218 | - | ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයට එක්වරක්වත් ලේකම් විසින් පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| මුදල් රෙගුලාසි 371 | 286,610 | සභාවේ නිලධාරින්ට සහ වෙනත් පාර්ශවයන්ට විවිධ ක්‍රියාකාරකම් සඳහා අවස්ථා 13 කදී ගෙවා තිබූ අත්තිකාරම් මුදල් පසුගිය වර්ෂ 1 සිට 19 දක්වා නිරවුල් කරගෙන නොතිබුණි. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු. 1,957,197 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 4,738,377 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | කුලී | 3,200,000 | - | 2,038,341 | 1,372,171 | 14,930,100 | - | 11,768,598 | 1,544,160 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 240,000 | - | 421,100 | - | 1,401,650 | - | 1,518,317 | - |
| (iii) | වෙනත් ආදායම් | 3,776,530 | - | 4,498,983 | 3,431,884 | 3,787,500 | - | 4,716,014 | 5,444,855 |

**2.2.2 කුලි**

**-----**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වාහන බදු දීම වෙනුවෙන් අයවියයුතු කුලි රු. 126,800 ක් මුදල අයකර ගැනීම සඳහා පසුගිය වර්ෂ දෙකක්තුල සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) එකතුව රු. 1,238,924 ක්වූ බදුකරුවන් 13 දෙනෙක්ගෙන් අයවියයුතු මුදල අයකර ගැනීම සඳහා පසුගිය වර්ෂ 01 සිට 07 දක්වා සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**------------------------------**

උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 21,470 ක් හා මුද්දර ගාස්තු රු. 2,170,383 ක් විය.

**3 මෙහෙයුම් සමාලෝචිතය**

**----------------------------**

**3.1 කාර්‍ය සාධනය**

**-----------------**

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**---------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කසල බැහැර කරන ස්ථානයන් සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ii) සෞඛ්‍ය කම්කරුව වාර්ෂිකව වෛද්‍ය පරීක්ෂණවලට භාජනයකර නොතිබුණි.

(iii) අපද්රව්‍ය වර්ගීකරණය කර ලබා ගෙන නොතිබුණි.

(iv) අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳ නිලධාරින්ට පුහුණු ලබාදී නොතිබුණි.

(v) අපද්‍රව්‍ය කළමනාකරණයට අවශ්‍ය තොරතුරු සහ දත්ත ක්‍රමයක් පවත්වා නොතිබුණි.

(vi) ඝණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රියකරණයෙන් තොරව පරිසරය දූෂණය වන ආකාරයට ගිණි තබා පුළුස්සනු ලැබේ.

(vii) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(viii) කසල කළමනාකරණ සඳහා වැයවන මුදල් ප්‍රමාණය රැස්කර ගැනීම සඳහා කසළ බදු අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**3.2 අවිධිමත් ගනුදෙනු**

---------------------

සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන 11 ක් සඳහා වාහන භාර නිලධාරියාගේ සහ රියදුරුගේ නොසැලකිල්ල හේතුවෙන් ගෙවීමට සිදුවූ රු. 7,775 ක දඩ මුදල සභා අරමුදලින් ගෙවා තිබුණි.

**4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-------------------------------------------

**4.1 අභ්‍යන්තර විගණනය**

------------------------

සභාවේ කටයුතු විගණනය කර එහි ක්‍රියාකාරකම් කාර්යක්ෂමතාවයෙන් කරගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන පරික්ෂණ වලින් ලද නිර්දේශයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**4.2 අයවැය පාලනය**

--------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය වියදම් අතර රු. 1,104,677 ක අහිතකර විචලනයක් නිරීක්ෂණය විය.

**5 පද්ධති හා පාලන**

--------------------

විගණනයේ නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

.

| පද්ධතිය | | අඩුපාඩු |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ප්‍රධාන ලෙජරය නිසිපරිදි පවත්වා නොතිබුණි. |
| (ආ) | ආදායම් | දේපල තක්සේරුකර වරිපනම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. |